•

# නවරත්න විෂ වෙද පරපුර

පාරම්පරික වෛද්‍ය එස්.එන්.පී.ඩබ්.ජී. කිරිහාමි

මෙම වෙද පරම්පරාව සර්ප විෂ ප්‍රතිකාර සම්බන්ධයෙන් නමක් දිනා ඇති වෙද පරම්පරාවකි. මන්ත්‍ර භාවිතයෙන් ප්‍රතිකාර යෙදීම මෙහි පවතින විශේෂතාවයකි.

**සර්ප දෂ්ටයක් සිදුවූ රෝගියෙකු සඳහා ප්‍රතිකාර යොදන ආකාරය**

මුලින්ම රෝගියා සඳහා එළගිතෙල් තේ හැඳි 01ක් ලබාදෙයි. ඉන්පසු ප්‍රාණජීව ගුලිය ලබාදෙයි. එය ගම්මිරිස් ඇට 08ක් සුදුළූණු බික් 01ක් සමග අඹරා එවේලේ සාදා ගනී. එය දෙහි ඇඹුල ට දියකර රෝගියා ට ලබාදෙයි. පසුව විෂ ඇදිම සඳහා විෂ ගල තැබීම සිදුකරයි. ඉන්පසුව මන්ත්‍ර ප්‍රතිකාර සිදුකරයි. එහි දී දුම්ඇල්ලීම සඳහා පස් පැඟිරි දර පුළුස්සා ඊට මතුරන ලද කට්ටකුමංජල් යොදා මතුරමින් දුම් අල්ලයි. ඉන්පසු මැල්ලුම් යොදයි. ඒ සඳහා තුන්බෝ අත්තන කොළ පොතු, දෙහි කොල පොතු ආදිය ඒකීය ව යොදා ගනී. ඉදිමුම ඇතිවිට ප්‍රලේපයක් ලෙස ලුණුදෙහි, දෙහි ඇඹුලෙන් අඹරා ගෑම ද තැල් කොළ දෙහි ඇඹුලෙන් අඹරා ගෑම ද සිදු කරයි. රෝගියා ට බෙහෙත් කැඳ වර්ග ලබාදීම ද කරනු ලැබේ. ඒ අනුව මුලින්ම කරපිංචා කැඳ ද දෙවනු ව සප්සඳ කැඳ ද එළගිතෙල් දමාදෙනු ලැබේ. අවසානය ට කෂාය දෙනු ලැබේ. වැල් මී, වැල්මදට, කොහොඹ පොතු කලං 04 බැගින් ගෙන 8-1 ට සිඳ එළගිතෙල්, පිටිසීනී දමා දීම ප්‍රධානම කෂායයි.